වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
Annual Report

# 2018




**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
**இலங்கை அச்சுக நிறுவகம்**
திறன் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சு
SRI LANKA INSTITUTE OF PRINTING
Ministry of Skills Development & Vocational Training

# වාර්ෂික වාර්තාව
# 2018

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදි)

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
ෆැක්ස් : 0112686162
ඊ මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

| | |
|---|---|
| නම | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය |
| ස්ථාපනය | 1984 අංක 18 දරණ පාර්ලිමේන්තු ආඥා පනත අනුව පිහිටුවා ඇත. 1985 අංක 16 දරණ දේශීය ආදයම් සංශෝධන පනත අනුව ආදයම් බදුවලින් නිදහස් කොට ඇත. |
| ලිපිනය | නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08. |
| දුරකථනය | 0112686162, 0112679791 |
| ෆැක්ස් | 0112686162 |
| ලියාපදිංචි කාර්යාලය | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08. |
| බැංකු | මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව. |
| විගණනය | 1. ඩී. එච්. පී. මුණවීර සහ සමාගම<br>2. විගණකාධිපති දෙපාර්තමේන්තුව |

# පටුන


| | |
|---|---|
| 1.හැදින්වීම | 01 |
| 2.ආයතනික උපක්‍රම හා කාර්ය භාරයන් | 02 |
| 3.ආයතනයේ අරමුණු | 02 |
| 4.ආයතනයේ ශක්තිය | 02 |
| 5.දැක්ම සහ ආකල්ප | 05 |
| 6.පාලනඅධිකාරිය | 07 |
| 7.කාර්යමණ්ඩලය | 07 |
| 8.ආයතනික ව්‍යුහය | 08 |
| 9.කථිකාචාර්ය මඩුල්ල | 09 |
| 10.ශාඛාවන් | 11 |
| 11.පුහුණු පාඨමාලා | 12 |
| 12.වැඩමුළු හා සම්මන්ත්‍රණ | 13 |
| 13.වෘත්තීය සංවර්ධන මාර්ගය | 15 |
| 14.ශිෂ්‍ය දත්ත | 17 |
| 15.මූල්‍ය දත්ත | 18 |
| 16.වාර්ෂික ගිණුම් වාර්තාව | 19 |
| 17.විගණකාධිපති වාර්තාව සහ ආයතනික පැහැදිලි කිරීම | 39 |
| 18.මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග | 54 |

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයේ ප්‍රථම වෘත්තීය සන්ධානය වූ මෙම ආයතනය, එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරන අතර එහි ආරම්භක මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා නිරන්තරව යෙදී සිටී.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් මෙම ආයතනය ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එය මුද්‍රණ කර්මාන්තයට අදාල විද්‍යා සහ කාර්මික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහාත්, එම කාර්මිකයින්ගේ හැකියාවන් ඔප් නැංවීම සඳහාත් නොකඩවා පුළුල් වන ශිල්පීය ක්‍රම සහ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහාත් දියත් කළ ලාභ නොලබන සංවිධානයකි. එහෙයින් මෙම ආයතනයේ මූලික කාර්යභාරය වනුයේ රටෙහි සමාජ - ආර්ථික වර්ධනයට සරිලනසේ මෙම කර්මාන්තයේ නවීකරණයට අවශ්‍ය සහය ලබාදීමය.

### ආයතනික උපක්‍රම සහ කාර්යය භාරයන්:

වෙළඳ සහ වාණිජ ක්ෂේත්‍රයේ ශීඝ්‍රයෙන් පුළුල් වන්නා වූ තරඟකාරි පසුබිමක් තුල මුද්‍රණ සහ ගැෆික්ස් කර්මාන්තයේ දිනෙන් දින වර්ධනය වන නවීන තාක්ෂණය සහ කළමනාකරණ අවශ්‍යතාවයන් අනුව ශිල්ප ක්‍රමථ දැනුම සහ හැකියා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්වකීය උපක්‍රම සහ කාර්ය භාරයන් නැවත සකස් කිරීමේ, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක මෙන්ම අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිද නිරතව සිටී.

### ආයතනයේ අරමුණු:

- ශ්‍රී ලංකාවේ මුද්‍රණ ව්‍යාපාරයේ ප්‍රමිතිය නගා සිටුවීම සඳහා පවත්නා ශිල්පීය ක්‍රම, අමුද්‍රව්‍ය භාවිතයථ සැලසුම් කිරීම වැනි විෂයන් පිළිබඳ මුද්‍රණ ක්ෂේත්‍රයේ සේවකයන් පුහුණු කිරීම.
- මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳව පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.
- ආයතනය මගින් මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලා සඳහා සහතික සහ ඩිප්ලෝමා පිරිනැමීම.
- මුද්‍රණ ව්‍යාපාරයට අදාල නව විෂයමාලා සහ ශිල්පීය ක්‍රම පිළිබඳව සහ පවත්නා පාඨමාලා පිළිබඳව තොරතුරු සකස් කර පත්‍රිකා සහ වෙනත් වාරික ප්‍රකාශන මගින් සැපයීම සහ බෙදාහැරීම.
- විදේශීය මුද්‍රණ පාසැල් හෝ මුද්‍රණාලයන්හි පුහුණුව සඳහා දේශීය සිසුන්ට අනුග්‍රහය ලබාදීම සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් මගින් විදේශීය සිසුන්ට එම පහසුකම් මෙහි ලබාදීම.
- මෙරට මුද්‍රණ කර්මාන්තයේ උන්නතිය සඳහා මුද්‍රණ ව්‍යාපාරයේ නවීනතම ශිල්පීය ක්‍රමවේද සහ තොරතුරු ලබාගැනීම සඳහා විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගිවීම.

## ආයතන ශක්තිය:

වසර 15 කට අධික කාලයක් ඔස්සේ පුහුණු ආයතනයක් වශයෙන් මුද්‍රණ කර්මාන්තයට අදාල මූලික කටයුතු පිළිබඳව නිපුණත්වයක් ලබා ඇත්තා වූ මෙම ආයතනය, දැන් මෙම ක්ෂේත්‍රයේ ප්‍රධානතම ශිල්ප ආයතනය බවට පත්ව ඇති මෙම කර්මාන්තයේ සෑම අංශයක්ම ආවරණය වනසේ මැනවින් සකස් කළ ගැඹුරින් හැදෑරිය හැකි පුහුණු පාඨමාලාවන් සපයන මෙම ආයතනය උසස් මට්ටමෙ පරිගණක ඒකකයකින් සහ යන්ත්‍රෝපකරණ වලින්ද සමන්විතය. එමගින් අභ්‍යාසලාභීන්ට ඒවා පරිහරණය කිරීම පිළිබඳව මනා අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගතහැක. එමෙන්ම මෙහි වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වනුයේ තමන් සතු වඩාත් නවීනතම විශේෂඥ දනුම නිතිපතා ලබාදෙමින් නොකඩවා අභ්‍යාසලාභීනට මග පෙන්වන එම ආයතනයට අනුබද්ධව කටයුතු කරන ඉතා පළපුරුදු සහ වෘත්තිය සුදුසුකම් ඇත්තා වූ උපදේශකවරු සහ කථිකාචාර්යවරුන්ගෙන් සමන්විත ගුරු මඩුල්ල වේ.

මෙම ආයතනයේ කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල තක්සේරු කලහැකි මිණුම් දණ්ඩ වනුයේ මෙහි පාඨමාලා හදාරා විශිෂ්ඨ දියුණුව ලැබූ ව්‍යාපාරිකයින්ගේ සාර්ථකත්වය, දැනට මෙහි පාඨමාලා හදාරණ අභ්‍යාසලාභීන්ගේ උද්‍යෝගය, උනන්දුව සහ මෙහි පුහුණුව ලැබීම සඳහා ඇතුලත්වීමට අයදුම්කරුවන් අතර ඇත්තා වූ මහත් තරඟයද වේ.

වසර ගණනාවක් අප රටේ පැවති සංවෘත ආර්ථිකය යටතේ දළිතා වර්ධනය සඳහා තිබූ ඉඩ ප්‍රස්ථා සීමාසහිත වූ බැවින් මෙම ක්ෂේත්‍රය තුල යටපත්ව තිබූ ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරීත්වයට අවශ්‍ය කාර්මික ශිල්ප කළමණාකරණ ශක්තිය සහ වෘත්තීය දක්ෂතා වර්ධනය කිරීම සඳහා මෙම ආයතනය මහත් රුකුලක් වශයෙන් ආරම්භයේදී පිළිගනු ලැබීය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් විවිධ අංශයන්හි විශේෂ දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා පාඨමාලා කිහිපයක් සකස් කර ඇති අතර එමගින් මුද්‍රණ කළමණාකරණය පිළිබඳ පිළිගත් ඩිප්ලෝමාවක් දක්වා හැදෑරිය හැකිය.

SLIOP යනුවෙන් කෙටියෙන් හැඳින්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය අනුමත පුණ්‍යායතනයකි. එබැවින් එය වෙත දෙනු ලබන පරිත්‍යාග අයබදු ගෙවීමෙන් නිදහස් කර ඇත. ලාභ නොලබන සංවිධානයක් වන මෙය එහි දියුණුව සහ අරමුණු ව්‍යාප්ත කිරීම සඳහා මෙම කර්මාන්තයේ නිරත ව්‍යාපාරික ප්‍රජාවන්ගෙන් සහ හිතවතුන්ගෙන් සහාය අපේක්ෂා කරන්නීය.

මේ සම්බන්ධයෙන් මේ දක්වා අපට ආධාර කළ HEIDELBERG, DRUCK MACHINE AG, AGFA GEVAERT, APPLE MACINTOSH යන සංවිධාන ඇතුලු සෙසු අයට අපගේ ඉමහත් ප්‍රසාදය පුද වේ. තවද අපගේ වත්මන් සේවාවන් වඩාත් දියුණු කිරීම සඳහා නූතන යන්ත්‍රෝපකරණ අවශ්‍යව ඇති බැවින් ඒවා ලබාගැනීමට ඔබගේ පූර්ණ සහය ගෞරවයෙන් අපේක්ෂා කරන්නෙමු.

මෙම ක්ෂේත්‍රයේ විවිධ අංශයන් පිළිබඳව මෙහි දෙනු ලබන පුහුණුව තුළින් ලබාගන්නා වූ දැනුම එම ක්ෂේත්‍රයේ රැකියාවන් වලට අත්වැලක් වනු ඇත. මෙම ආයතනයෙන් සපයනු ලබන දැනුම සහ උසස් තාක්ෂණය තුලින් මුද්‍රණ කර්මාන්තයේ නිරත අයහට තම දේශීය මුද්‍රණ කටයුතු ප්‍රමිතියෙන් සහ තත්ත්වයෙන් ඉතා උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇත.

අභ්‍යාසලාභීන්ගේ දැනුම සහ හැකියාවන් දියුණු කිරීම සඳහා මෙම ආයතනයට වෘත්තීය මුද්‍රණ ශිල්පීන් ගණනාවකගේ සේවය ලබාගැනීමට හැකිවීම භාග්‍යයකි. මෙහි පාඨමාලාවන් සහ විෂය මාලාවන් පිළියෙල කිරීමද, අධ්‍යයන සැසිවාර මෙහෙයවීම සඳහා ද ඔවුන් සෘජුව සහභාගි වීම නිසා මෙම ආයතනයේ විවිධ අංශයන් බලාපොරොත්තු වන මට්ටමේ උසස් තත්ත්වයක පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

මුද්‍රණ ශිල්පයට අදාලව ඉතා උසස් තලයේ පුස්තකාලයක් ද මෙම ආයතනය සතුව ඇත. එමගින් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ඉතා ගැඹුරින් හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන්ට අවස්ථාව ලැබී ඇත.

# දැක්ම සහ ආකල්ප

## පොදුවේ (හැඳින්වීම)

සෑම මානව ක්‍රියාකාරකමක් සඳහාම මුද්‍රණ කලාව පදනම් වී ඇති බව පැවසුවහොත් එය ඉතා නිවැරදිය. එසේම, මෙම ක්ෂේත්‍රය සෑමවිටම වෙනස්වන තොරතුරු තාක්ෂණය සමඟ තාක්ෂණිකමය වෙනස්වීම් වලට භාජනය වෙමින්, වර්තමානයේ සහ අනාගතයේ පවත්නා ඉල්ලුම සඳහා විශාල දියුණුවක් කරා ගමන් කරමින් තිබේ. තවද මෙම ක්ෂේත්‍රය තුළ වේගවත්ව සිදුවන ශිල්පීය ක්‍රමවේදයන්ගේ වෙනස්වීම්, වඩා වැදගත් වන්නේ, ඊට අනුකූලව ජාත්‍යන්තර වෙළඳපොලේ ඉල්ලුමට ගැලපෙන පරිදි, රට තුළ වෙළඳ සහ කාර්මික පදනම නැවත සකස්වීමේ ක්‍රියාවලියක සිටින බැවිනි. එසේම මෙම ආයතනය විසින්, ඇසුරුම්කරණය, මුද්‍රණ සහ ප්‍රමිතිකරණය යන ක්ෂේත්‍ර තුළ පවත්නා නව අභියෝග සහ අවශ්‍යතා බොහෝ දුරට හඳුනාගෙන තිබේ.

ජාතික නිෂ්පාදන ඵලදායිතාවෙන් සහ ප්‍රමිතියෙන් උසස් තත්ත්වයකට ගෙන ඒමේ රජයේ වැඩපිළිවෙලට ආධාරකයක් වශයෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින්, කළමනාකරණ සහ අධීක්ෂණ නිලධාරීන් සඳහා කෙටිකාලීන පාඨමාලාවන් සකස්කර ක්‍රියාත්මක කරමින් පවතී. ඒ තුළින් ඔවුන්ගේ දැනුම සහ ශිල්පීය හැකියාව වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. නිෂ්පාදන ඵලදායිතාව සහ ප්‍රමිතිය යන්න වෙන්කළ නොහැකි මූලධර්මයන් දෙකක් වේ.

තවද ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම නිසා රට තුළට විදේශ ව්‍යවසායකයින් පැමිණීම, ඒ නිසා විදේශ ආයෝජන ගලා ඒම, නව තාක්ෂණික ශිල්පීය ඥානය සහ ව්‍යාපාරික ක්‍රමවේද භාවිතය, පෞද්ගලික අංශය දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම වැනි කරුණු නිසා, මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ දියුණුවට මහා පිටුවහලක් ලැබී තිබේ. මේ අනුව පෙනී යන්නේ නව අභියෝගවලට සහ අවශ්‍යතාවන්ට, අප මුහුණ දෙන්නා වූ ස්වභාවය මත, මෙම කර්මාන්තයේ අඛණ්ඩ සාර්ථකත්වය රඳා පවතින බවය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මේ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව තාක්ෂණික දියුණුවත් සමගම එහි පවත්නා සම්පත්වල සහ පුහුණු පාඨමාලාවල තත්ත්වය උසස් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාදාමයක යෙදී සිටියි. තවද මෙම ආයතනය පාසැල් හැරගිය අයවළුන් සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ මුද්‍රණ පාසල සමඟ එක්ව පවත්වනු ලබන CPtronic Heidlberg Printing Machine භාවිතය පිළිබඳ විශේෂ පාඨමාලාව සහ TWO Colour Stream Feeder Litho Machine Operations පුහුණු පාඨමාලාව, හේතුවෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා වැඩි වටිනාකමක් ලැබී තිබේ.

එසේම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය හා එක්ව මුද්‍රණ තාක්ෂණ සහ කලමනාකරණය, දෘශ්‍ය සන්නිවේදනය සහ කළමනාකරණය යන උසස් ඩිප්ලෝමා පාඨමාලා දෙක පවත්වාගෙන යාමට හැකිවීම, මෙම ආයතනය ලැබූ විශාල ජයග්‍රහණයක් සේ සැලකිය හැක. තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ එර් පාඨමාලාව සඳහා, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ උසස් ඩිප්ලෝමාව හදරා තිබීම මූලික සුදුසුකමක් ලෙස සැලකීම, ආයතනය ලැබූ ඉහළ පිළිගැනීමකි.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය හොඳින් ස්ථාපනය වෙමින් පවතින අතර, එමනිසා මුද්‍රණ තත්ත්වය ක්‍රමවත්ව දියුණු වීම අවශ්‍යය වේ. ඊට අමතරව වර්තමානයේ, විද්‍යුත් පෙර-මුද්‍රණ ක්‍රියාදාමයන් සමඟ මුද්‍රණ කර්මාන්තයේ ක්‍රියාකරකම් නවීකරණය වෙමින් පවතී. එසේම ශ්‍රී ලංකාව, මුද්‍රණයේ තත්ත්වය ආරක්ෂා කරගනිමින්, විදේශීය තරඟවලට අතුළුවීම තුළ, ඒ මගින් ලබාගන්නාවූ අවබෝධය සහ විශේෂඥතාවය මුද්‍රණ කර්මාන්තයේ දියුණුව සඳහා වැදගත් වේ.

වර්තමානයේදී, ශ්‍රී ලංකාවේ මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ විවිධ අංශයන් ගැන උසස් අධ්‍යාපනයක් ලබා දිය හැකි එකම ආයතනය, ශ්‍රී.ලං.මු.ආ. වේ. එසේම මෙම ආයතනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ යන්ත්‍ර උපකරණ ලබාදෙන්නේ නම්, මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය කරන සියලු පුහුණු පාඨමාලාවන් පැවැත්විය හැකිය. ඊට අමතරව මෙම කර්මානත්යේ තාක්ෂණිකමය ඉල්ලුම සපුරාලීමට අවශ්‍යය කරන ශිල්පීය ඥනය සහ ශිලපීය ක්‍රම පිළිබඳව, මුද්‍රණකරුවන්ට අවශ්‍ය පුහුණුව හා උපදෙස් ලබාදීමටද හැකිවේ. එසේම ආයතනයේ ඉඩප්‍රමාණය හා සම්පත් අතින් තවත් වැඩි දියුණු වූ විට ආයතනිකමය පරීක්ෂණ, මුද්‍රණ කඩදසි, තීන්ත පරීක්ෂණ සහ ප්‍රමිතිකරණය වැනි අමතර සේවාවන්ද අවශ්‍යකරන පාර්ශ්ව වෙත ලබාදියහැකිය.

## ආයතනය අලුත් නවාතැනකට

ඉහත සඳහන් සියලු කාරණා සැලකිල්ලට ගැනීමේදී ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රය පුළුල් වීම තුල, ශ්‍රී ලජකා මුද්‍රණ ආයතනයේ සේවාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සියලු පහසුකම් සහිත තාක්ෂණික පුහුනු ආයතනයක් ගොඩනැගීම අවශ්‍ය වී ඇත. එසේම මුද්‍රණ ආයතනයේ ඇති අඩු ඉඩකඩ සහ පහසුකම් නිසා ඇතිවන බාධා පාලනාධිකාරිය විසින් හොඳින් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා රජය සමඟ සියලු පහසුකම් සහිත පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට මාර්ගය සකස් කරගෙන තිබේත

මේ සඳහා පර්චස් 40ක ඉඩමක්, රජයේ මුද්‍රණාල පරිශ්‍රයෙන් ලැබී ඇති අතර, එම පුහුණු මධ්‍යස්ථානය ගොඩනැගීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය උත්සාහ ගනිමින් සිටී.

## පාලන අධිකාරිය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

| | | |
|---|---|---|
| ජී.කේ.ඩී.ලියනගේ මිය | - | රජයේ මුද්‍රණාලයාධිපති / සභාපති |
| එස්.ආලෝක බණ්ඩාර | - | සභාපති-රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව / සාමාජික |
| රංජිත් ප්‍රනාන්දු මයා | - | සභාපති-ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමය / සාමාජික |
| රොහාන් වික්ටෝරියා මයා | - | සභාපති-ශ්‍රී ලංකා ඇසුරුම්කරුවන්ගේ සංගමය / සාමාජික |
| පී.එච්.එල්.වී ද සිල්වා මයා | - | සාමාජික |
| ප්‍රසන්න කරුණාතිලක මයා | - | සාමාජික |
| එල්.ආර්.කමල් ප්‍රියංකර මයා | - | සාමාජික |
| පී.සජිත් සුමනසිරි මයා | - | සාමාජික |
| ඩී.පී.ප්‍රසන්න ද සිල්වා මයා | - | සාමාජික |

## කාර්ය මණ්ඩලය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

| | | |
|---|---|---|
| සිසිර බරනගේ මහතා | - | ලේඛකාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී |
| නිහාල් ඩයස් මහතා | - | අධ්‍යයන අධ්‍යක්‍ෂ |
| හිමාෂි ෆොන්සේකා මහත්මිය | - | පාලන හා ගිණුම් සහකාර |
| තනුජා දමයන්ති මහත්මිය | - | උපදේශක |
| චමල් හෙට්ටිආරච්චි මහතා | - | සහකාර කථිකාචාර්ය |
| යූ.එම්.සනත් මානගේ මහතා | - | උපදේශක |
| සමන්ත කුළතුංග මහතා | - | උපදේශක |
| ඩබ්.ඒ.එම්.ලංකාතිලක මහතා | - | කළමණාකරන සහකාර |
| ඊස්රාචාරී ඒඩින් මහතා | - | කාර්යාල කාර්ය සහායක |

# <u>පරිපාලන සැකිල්ල</u>




**අනුමත කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| ලේඛකාධිකාරී | - 01 |
| පාඨමාලා අධ්‍යක්ෂ | - 01 |
| සහකාර කථිකාචාර්ය | - 01 |
| උපදේශකවරු | - 07 |
| ගිණුම් හාපරිපාලන නිලධාරී | - 01 |
| ලිපිකරු | - 01 |
| කර්යාල කාර්ය සහායක | - 01 |

**වර්තමාන කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| ලේඛකාධිකාරී | - 01 |
| පාඨමාලා අධ්‍යක්ෂ | - 01 |
| සහකාර කථිකාචාර්ය | - 01 |
| උපදේශකවරු | - 05 |
| ගිණුම් හාපරිපාලන නිලධාරී | - 01 |
| ලිපිකරු | - 01 |
| කර්යාල කාර්ය සහායක | - 01 |

# බාහිර කථිකාචාර්ය මඩුල්ල

- ආචාර්ය ඒ. ඒ. සී. අබේසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- එස්. බී. රණසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රුවනි චන්ද්‍රසේකර මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- චන්දන විජේකෝන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ජී. එස්. පී. රන්දිවෙල මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ජී. ආර්. ටී. සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- එස්. සසිදරන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ඒ. එච්. සී. පී. අතපත්තු මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ගුණපාල රණවීරගේ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය සම්පත් කෙහෙල්වලතැන්න මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- නුරාදි ජයසිරි මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ඒ. ඩබ්. ජේ. සී. අබේගුණසේකර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ගිම්හානි ඒකනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රොෂෙල් විමලසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- කේ. ඩී. ජේ. සමන්ති මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය එච්. සී. කරුණාරත්න - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- කාංචනා විජයවර්ධන මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය රාජිත සිල්වා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය ආර්. සෙන්තිරාජා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය කේ. කජේන්ද්‍ර - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ශානිකා ලක්මාලි මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රුවංගි චන්ද්‍රසේකර මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- අශෝක නානායක්කාර මහතා - උපදේශක ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- ගංගානි ලියනගේ මහත්මිය - රජයේ මුද්‍රණාලාධිපති සහ සභාපති ශ්‍රී.ලං.මු.ආ.
- බී. පතිරණ මහතා - මුද්‍රණ කළමණාකරු,ප්‍රින්ට් කෙයාර් පුද්ගලික සමාගම
- රසන්ත චන්ද්‍රතිලක මහතා නිෂ්පාදන කළමණාකරු රිවිර පුවත්පත් ආයතනය
- රෙව්. ඩී. බිලිං මහතා - නිර්මාණ උපදේශක

| | | |
|---|---|---|
| ▪ | ජගත් මදනායක මහතා | - වෙළඳ කළමණාකරු, ඩී. අයි. සී. ලංකා පුද්ගලික සමාගම |
| ▪ | එම්. ඒ. ජස්ටින් මහතා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කඩදසි තාක්‍ෂණය |
| ▪ | සිසිර බරනගේ මහතා | - ප්‍රධාන විධායක නිළධාරී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය |
| ▪ | එම්. ඩී. මහින්දපාල මහතා | - උපදේශක සිනමාකරණය |
| ▪ | ස්ටැන්ලි හෙට්ටිආරච්චි මහතා | - අධ්‍යක්‍ෂ වෘත්තීය හා තාක්‍ෂණික විශ්ව විද්‍යාලය<br>කථිකාචාර්ය හා උපදේශක සිනමාකරණය |
| ▪ | ඔස්මන් ජයා මහතා | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ලේක්හවුස් ආයතනය |
| ▪ | රෝහන් පියරතන මහතා | - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය |
| ▪ | ප්‍රසන්න ජයරත්න මහතා | - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය |
| ▪ | ජේ. ජී. නයෝමි නිරංගා මෙනෙවිය | - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය |
| ▪ | සුභසිංහ පෙරේරා මහතා | - කථිකාචාර්ය පොත් මුද්‍රණය සහ නිමාව |
| ▪ | ජේ. ඒ. ඩී. ප්‍රේමතුංග මහතා | - කථිකාචාර්ය පොත් බැඳුම්කරණය සහ නිමාව |
| ▪ | ඩබ්. එස්. ප්‍රියන්ත මහතා | - කථිකාචාර්ය මුද්‍රණ පිරිවැයකරණය |
| ▪ | ධම්මික විමලරත්න මහතා | - කථිකාචාර්ය මුද්‍රණ තාක්‍ෂණය |
| ▪ | නලින් විජේනායක මහතා | - කථිකාචාර්ය වෙබ් අඩවි නිර්මාණකරණය හා MS Office |
| ▪ | ලක්මාල් පෙරේරා | - කථිකාචාර්ය වෙබ් අඩවි නිර්මාණකරණය හා MS Office |
| ▪ | නීල් කුරේ | - කථිකාචාර්ය ඩිජිටල් ඇනිමේෂන් තාක්‍ෂණය |

# ශාඛාවන්

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව ශාඛාවක් මාතලේ පවත්වාගෙන යනු ලැබේ.

**ලිපිනය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ
දුරකථනː 0662222172

මාතලේ ශාඛාවේ පවත්වනු ලබන පාඨමාලාවන් පහත දැක්වේ

1. පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම
2. පරිගණක මුද්‍රණ රටා
3. මයික්‍රොසොෆ්ට් ඔෆිස්
4. වෙබ් ඩිසයිනින්

# පුහුණු පාඨමාලා - 2018

| පාඨමාලාව | කාලය | පාඨමාලා ගාස්තුව |
|---|---|---|
| මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබද | වසර 02 | රු.140,000/- |
| උසස් ඩිප්ලෝමා පාඨමාලාව | | |
| දෘශ්‍ය සන්නිවේදනය හා කළමණාකරණය පිළිබද | වසර 02 | රු.140,000/- |
| උසස් ඩිප්ලෝමා පාඨමාලාව | | |
| ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව | අවුරුදු 01 | රු.36,500/- |
| පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (NVQ) පාඨමාලාව | පැය115 | රු.21,500/- |
| පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (SLIOP)පාඨමාලාව | පැය114 | රු.17,000/- |
| පරිගනක ආශ්‍රිත අකුරු ඇමිනීම පිළිබද පාඨමාලාව | පැය120 | රු.13,500/- |
| මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබද සහතික පත්‍ර පාඨමාලාව | සති20 | රු.12,500/- |
| පිරිවැය හා ඇස්තමේන්තුකරණය පිළිබද පාඨමාලාව | වසර 01 | රු.18,000/- |
| ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබද පාඨමාලාව | වසර 01 | රු.18,000/- |
| ආංකික පෙර මුද්‍රණය පිළිබද පාඨමාලාව | වසර 01 | රු.22,500/- |
| පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබද පාඨමාලාව | සති 26 | රු.17,500/- |
| මුද්‍රණ රටා පිළිබද පාඨමාලාව | වසර 01 | රු.15,500/- |
| පොත් බැදුම්කරණය හා නිමාව පිළිබද පාඨමාලාව | සති 28 | රු.20,000/- |
| වෙබ් අඩවි නිර්මාණය පිළිබද පාඨමාලාව | සති 20 | රු.16,500/- |
| ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබද පූර්ණ කාලීන පාඨමාලාව | මාස 14 | රු.22,500/- |
| අරේකීය සජීවීකරනය පිළිබද පාඨමාලාව | සති 16 | රු.23,000/- |
| ආංකීය සජීවී කරණය පිළිබද පාඨමාලාව | සති 24 | රු.22,500/- |
| පරිගණක දෘඩාංග එකලස් කිරීම පිළිබද පාඨමාලාව | සති 14 | රු.12,500/- |
| ඔටෝකැඩ් පාඨමාලාව | සති 20 | රු.17,000/- |

# 2018 වසරේ පැවැත්වූ වැඩමුලු හා සම්මන්ත්‍රණ

| | සම්මන්ත්‍රණය | දිනය | සහභාගීත්වය |
|---|---|---|---|
| 1. | පරිගණක මුද්‍රණ රටා සහ වෙබ් ඩිසයින් | 2018.01.16 | 31 |
| 2. | පරිගණක මුද්‍රණ රටා | 2018.03.16 | 44 |
| 3. | පොත් බැඳීම හා නිමා කරණය | 2018.05.10 | 63 |
| 4. | පරිගණක මුද්‍රණ රටා | 2018.05.17 | 30 |
| 5. | පරිගණක මුද්‍රණ රටා | 2018.09.13 | 26 |
| 6. | පොත් බැඳීම හා නිමා කරණය | 2018.09.14 | 19 |

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
# Sri Lanka Institute of Printing
ESTABLISHED BY AN ACT OF PARLIAMENT IN 1984

## CAREER DEVELOPMENT PATH





Sri Lanka Institute of Printing
No. 118, Dr. Danister De Silva Mawatha, Colombo 08
sliopreg@sltnet.lk
www.sliop.edu.lk
0112 686162, 0112 679791
0112 686162



SLIOP/ACD/DO/10 DOI:02-01-2014 REV:00 ISSUE NO:01

# ශිෂ්‍ය දත්ත - 2018

| පාඨමාලාව | ඉලක්ක සිසුන් ගණන | තත්‍ය සිසුන් ගණන |
|---|---|---|
| මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 20 | 12 |
| දෘශ්‍ය සන්නිවේදනය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 15 | 21 |
| ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව | 72 | 38 |
| පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (NVQ) පාඨමාලාව | 50 | 142 |
| පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (SLIOP) පාඨමාලාව | 250 | 171 |
| පරිගනක ආශ්‍රිත අකුරු ඇමිනීම පිළිබඳ පාඨමාලාව | 75 | 116 |
| මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ පාඨමාලාව | 40 | 166 |
| ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පාඨමාලාව | 30 | 52 |
| ආංකික පෙර මුද්‍රණය පිළිබඳ පාඨමාලාව | 15 | 21 |
| පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පාඨමාලාව | 30 | 35 |
| මුද්‍රණ රටා පිළිබඳ පාඨමාලාව | 20 | 38 |
| පොත් බැඳුම්කරණය හා නිමාව පිළිබඳ පාඨමාලාව | 40 | 62 |
| වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පාඨමාලාව | 30 | 52 |
| ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පූර්ණ කාලීන පාඨමාලාව | 40 | 29 |
| අරේඛීය සජීවීකරනය පිළිබඳ පාඨමාලාව | 15 | 28 |
| ආංකීය සජීවී කරණය පිළිබඳ පාඨමාලාව | 12 | 8 |
| දෘඩාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳ පාඨමාලාව | 10 | 13 |

# මූල්‍ය දත්ත - 2018

| **ප්‍රධාන කාර්යාලය** | **ඇස්තමේන්තුගත ආදායම සහ වියදම** | **තථ්‍ය ආදායම සහ වියදම** |
|---|---|---|
| මෙහෙයුම් ආදායම්<br>මෙහෙයුම් නොවන ආදායම් | රු.18,811,500.00<br>රු. 6,551,851.00 | රු. 21,381,576.00<br>රු. 8,698,311.00 |
| ආදායම් වල එකතුව<br>වියදම්<br>මෙහෙයුම් ලාභය/අලාභය | රු. 25,363,351.00<br>රු. 17,909,358.00<br>රු. 902,142.00<br>රු. 7,453,993.00 | රු. 30,079,887.00<br>රු. 20,731,144.00<br>රු. 650,432.00<br>රු. 9,348,743.00 |
| **මාතලේ ශාඛාව** | **ඇස්තමේන්තු ගත ආදායම/වියදම** | **තථ්‍ය ආදායම සහ වියදම** |
| ආදායම<br>වියදම<br>ලාභය/අලාභය | රු. 750,000.00<br>රු. 587,077.00<br>රු. 162,923.00 | රු. 596,000.00<br>රු. 699,596.00<br>(රු. 103,596.00) |

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්
වර්ෂය සඳහා ගිණුම් වාර්තා

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

**නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.**

**විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් | 1 | 21,467,500.00 | 22,655,394 |
| මාතලේ ශාඛාවෙන් ලද ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | 2 | (103,596.13) | (143,057) |
| පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම් | 3 | (9,436,221.40) | (7,836,800) |
| **සේවක වියදම් හා මෙහෙයුම් පිරිවැයට පෙර ආදායම** | | **11,927,682.47** | **14,675,536** |
| අනෙකුත් ආදායම් | 4 | 17,672.00 | 23,401 |
| **මෙහෙයුම් ආදායම** | | **11,945,354.47** | **14,698,937** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක වියදම් | 5 | (4,145,354.26) | (5,501,951) |
| දේපල උපකරණ හා ක්‍රමක්ෂය | 6 | (2,132,045.93) | (2,209,630) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 7 | (5,017,522.82) | (5,290,937) |
| **මුළු මෙහෙයුම් වියදම්වල එකතුව** | | **(11,294,923.00)** | **(13,002,517)** |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **650,431.47** | **1,696,420** |
| ශුද්ධ මූල්‍ය ආදායම | 8 | 8,698,311.25 | 7,199,840 |
| **වර්ෂයේ අතිරික්තය** | | **9,348,742.72** | **8,896,260** |
| අනෙකුත් විස්තරාත්මක ආදායම් | | - | - |
| **වර්ෂයට අදාල විස්තරාත්මක ආදායම සමුච්චිත අරමුදලට මාරු කිරීම** | | **9,348,742.72** | **8,896,260** |

**මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.**

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
## නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8.
## මූල්‍ය තත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 9 | 4,965,540.76 | 5,294,220 |
| අස්පෘෂ්‍ය වත්කම් | 10 | 2,970.84 | 57,079 |
| නොනිමි වැඩ - යන්ත්‍ර | | 68,085,671.09 | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **73,054,182.69** | **5,351,300** |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 11 | 4,790,065.67 | 5,746,012 |
| අත්තිකාරම් හා කලින් කල ගෙවීම් | 12 | 1,650,979.49 | 9,873 |
| කෙටිකාලීන ආයෝජන | 13 | 71,339,882.61 | 78,647,482 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 14 | 3,830,083.94 | 3,564,182 |
| **මුළු ජංගම වත්කම්** | | **81,611,011.71** | **87,967,548** |
| **මුළු වත්කම්** | | **154,665,194.40** | **93,318,849** |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **අරමුදල්** | | | |
| සමුච්චිත අරමුදල | 15 | 99,859,882.93 | 90,511,140 |
| **මුළු අරමුදල්** | | **99,859,882.93** | **90,511,140** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 16 | 1,401,291.00 | 1,134,549 |
| ආධාර ලැබීම් | | 50,000,000.00 | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **51,401,291.00** | **1,134,549** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් | 17 | 3,404,020.47 | 1,673,159 |
| **මුළු ජංගම වගකීම්** | | **3,404,020.47** | **1,673,159** |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **154,665,194.40** | **93,318,849** |

**මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.**

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
## නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
## සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල | එකතුව |
|---|---|---|
| | රු. | රු. |
| 2017/01/01 දිනට ශේෂය | **81,614,880.26** | **81,614,880.26** |
| වසරේ අතිරික්තය | 8,896,259.95 | 8,896,259.95 |
| **2017/12/31 දිනට ශේෂය** | **90,511,140.21** | **90,511,140.21** |
| වසරේ අතිරික්තය | 9,348,742.72 | 9,348,742.72 |
| **2018/12/31 දිනට ශේෂය** | **99,859,882.93** | **99,859,882.93** |

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| වියදමට වැඩි ආදායම | 9,348,743 | 8,896,260 |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය | 2,132,046 | 2,209,630 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 266,742 | 517,088 |
| පොළී ලැබීම් | (8,675,466) | (7,176,117) |
| ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | 3,072,065 | 4,446,861 |
| ණයගැතියන් හා අනෙකුත් ලැබීම්වල (වැඩිවීම්) /අඩුවීම් | (685,160) | 627,590 |
| ගෙවිය යුතු වියදම්වල (අඩුවීම්) / වැඩිවීම් | 1,730,862 | 258,528 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 4,117,767 | 5,332,979 |
| පාරිතෝෂික ගෙවීම් | - | (492,063) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 4,117,767 | 4,840,916 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| පොළී ලැබීම් | 9,601,147 | 5,834,174 |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (69,834,929) | (2,949,888) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (60,233,782) | 2,884,286 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ආධාර ලැබීම් | 50,000,000 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 50,000,000 | - |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වලට සිදු වූ ශුද්ධ බලපෑම | (6,116,015) | 7,725,202 |
| පසුගිය වසරේ මුදල් හා මුදල් වලට සමාන දෑ | 77,419,017 | 69,693,815 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ | 71,303,001 | 77,419,017 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ** | | |
| බැංකු මුදල් | 3,825,013 | 3,558,809 |
| කෙටිකාලීන ආයෝජන | 67,472,917 | 73,854,835 |
| අතැති මුදල් | 5,071 | 5,373 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ | 71,303,001 | 77,419,017 |

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 1984 වර්ෂයේදී අංක 18 දරණ මුද්‍රණ ආයතන පනත යටතේ පිහිටුවා ඇත. ආයතනයේ ලියාපදංචි කාර්යාලය අංක 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.2 මූලික කටයුතු හා මෙහෙයුම්වල ස්වාභවය

2012 වර්ෂයේදී මුද්‍රණ ආයතනය පහත සඳහන් කටයුතුවල යෙදී ඇත.

අ. මුද්‍රණ කටයුතු පිළිබඳ පාඨමාලා පැවැත්වීම

ආ. මුද්‍රණ කර්මාන්තයේ අළුත් තාක්ෂණ ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.

ඇ. මුද්‍රණ කටයුතු පිළිබඳ උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම

ඈ. මුද්‍රණ කර්මාන්තයේ රැකියා සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රමිතීන්

2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත්කර තිබේ.

මුද්‍රණ ආයතනයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වත්කම් හා වගකීම් සාධාරණ අගය මත ගිණුම් ගත කිරීම හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

2.3 භාවිතා කරන ලද වැදග්ත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනාගතයට අදාල වන ඉතා වැදගත් සමහර ගිණුම්කරණ උපකල්පන භාවිතා කිරීමට සිදුවේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදි කළමනාකාරිත්වය විසින් පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයක්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත.

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

**අඛන්ඩ පැවැත්ම**

සැලකිය යුතු අනාගත කාලයක් සඳහා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යාමට හැකි බවට කළමණාකාරීත්වය තක්සේරු කර ඇත. තවදුරටත් අඛන්ඩ පැවැත්ම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සැලකිය යුතු අනුමානයන් යොමු කල හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකාරීත්වය නොදැන සිටින බවත් සහ මෙහෙයුම් කටයුතු ඇවර කිරීමට හෝ අවසන් කිරීමට ඔවුන්ට අදහසක් නොමැති බවය.

**මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සාධාරණ අගය මත දක්වා ඇත. සාධාරණ අගය තීරණය කිරීමට වෙළඳපොළ මිල ගණන් සොයා ගත නොහැකි විට ඒ සඳහා අනෙකුත් අගය කිරීම් ක්‍රම උපයෝගී කර ගනී.

**2.4 මූල්‍ය උපකරණ ආරම්භක හඳුනා ගැනීම සහ පසු අගය කිරීම**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 11,12 සහ 11.41 ට අයත් විෂය පථය යටතේ මූල්‍ය උපකරණ වර්ග කර ඇත. මූල්‍ය වත්කමක ආරම්භය හඳුනාගැනීමේදී මුද්‍රණ ආයතනය වර්ගීකරණය කරනු ලබයි.

**2.4.1 හඳුනා ගැනීමේ දිනය**

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ගනුදෙනුව සිදු වු දිනයේදී හඳුනා ගැනේ.

**2.4.2 මූල්‍ය උපකරණවල ආරම්භක අගය කිරීම**

ආරම්භක හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ග කිරීම එවායේ පරමාර්ථය, ගති ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේදී කළමනාකරුවන්ගේ අභිප්‍රාය මත රඳා පවතී.

**2.4.3 මූල්‍ය උපකරණ වල පසු අගය කිරීම**

මුද්‍රණ ආයතනය මුල් අගය කිරීමෙන් පසුව සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම මූල්‍ය උපකරණ වල ගනු දෙනු මිල හා සාධාරණ අගයෙහි වෙනනස්වීම් හඳුනා ගනී.

**2.5 මූල්‍ය උපකරණ හඳුනා නොගැනීම**

**2.5.1 මූල්‍ය වත්කම්**

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් වල කොටසක් යම් තැනක අදාළ වන පරිදි) පහත සඳහන් අවස්ථාවල හඳුනා නොගනී.

- වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය අවසන් වී තිබීම
- මුද්‍රණ ආයතනය විසින් වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර තිබීම.

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

**2.5.2 මූල්‍ය වගකීම්**

වගකීම් යටතේ වන බැඳීම් නිදහස් වූ විට හෝ අහෝසි වූ විට හෝ කාලය ඉකුත් වූ අවස්ථාවක මූල්‍ය වගකීම් හඳුනා නොගනු ලැබේ. තිබෙන මූල්‍ය වගකීමක් එම ණය හිමියාගේම වෙනත් මූල්‍ය වගකීමකින් සැලකිය යුතු වෙනත් කොන්දේසි යටතේ හෝ දැනට තිබෙන වගකීම්වල කොන්දේසි සැලකිය යුතු සංශෝධනය වීමක් යටතේ, ප්‍රතිෂ්ඨාපනය වූ අවස්ථාවක, එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙසත් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ වල හඳුනා ගනු ලැබේ.

**2.5.6 මූල්‍ය වත්කම්වල අපහායනය**

සෑම වාර්තාකරණ දිනයකදීම මුද්‍රණ ආයතනය විසින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනයට ලක් වී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇති බවට සලකනු ලබන්නේ වත්කමක ආරම්භක හඳුනා ගැනීමෙන් පසු සිදු වී තිබෙන සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයන් වශයෙන් (දරන ලද අලාභ සිද්ධියක්) අපහායනයට අදාළ විෂයානුබද්ධ සාක්ෂි ඇත්නම් සහ විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් වල සහ මූල්‍ය සමූහගත අනාගත මුදල් ප්‍රමාණවල බලපෑමක් කල හැකි අදාළ අලාභ සිද්ධිය (සිද්ධීන්) ඇති වී තිබෙන විටය.

**2.6 දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ දෛනික නඩත්තු වියදම් එකතු කිරීමක් නොමැතිව සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත හානි වන අගය හීන වීම් අඩුකල පිරිවැය මත දැක්වේ.

වත්කමේ ඉතිරි ඵලදායී ජීවකාලය සහ අගය ක්ෂයවීම පිළිබඳ විධි ක්‍රම මූල්‍ය වර්ෂය අවසානයේදී විමර්ශනය කරනු ලබයි. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පිරිවැය මත සරල මාර්ග ක්ෂය ක්‍රමයටය. ක්ෂය වීමට අදාළ අනුපාත පහත දැක්වේ.

| | |
|---|---|
| පරිගණක | අවුරුදු 3 |
| යන්ත්‍ර හා අනෙකුත් | අවුරුදු 10 |

විකිණීමේදී හෝ දේපල,පිරියත හා උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන අවස්ථාවක ඒවා හඳුනා නොගනු ලැබේ. එවැනි අවස්ථාවකදී සිදුවන ලාභ හෝ අලාභ (වත්කමේ වත්මන් අගය ලෙස ගෙන යන ප්‍රමාණය සහ එය විකිණීමේදී ලද ශුද්ධ ආදායම අතර ගණනය කරන ලද වෙනස) එකී වත්කම මුළුමනින්ම නොසලකා හරින ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුල ඇතුලත් කරනු ලැබේ.

D.H.P. MURAWEERA & CO. CHARTERED ACCOUNTANTS

**2.7 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන්**

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් ගනුදෙනුව සිදුවූ මිලට හඳුනා ගනු ලැබේ. එම ශේෂයන් සඵලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලැබේ.

**2.8 රාජ්‍ය ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදාන ලැබීමේ සියළු අවශ්‍යතා සපුරාලු විට එම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරයි.

**2.8 සේවක ප්‍රතිලාභ වගකීම්**

**2.8.1 සේවක අර්ථසාධක අරමුදල/සේවක භාරකාර අරමුදල**

සේවකයින් සහ මුද්‍රණ ආයතනය සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල අනුමත කරන ලද අනුප්‍රමාණයන්ගෙන් දායක වනු ලැබේ.

**2.8.2 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්**

පාරිතෝෂික වෙන්කිරීම් සඳහා ව්‍යාපෘති ඒකක බැර (Projected Unit Credit) ක්‍රමය සරල කර යොදා ගෙන ඇත.

**2.9 වෙන්කිරීම්**

වගකීම් පිළිබඳ සත්‍ය ඇස්තමේන්තුවක් කළ හැකි සහ එම වගකීම් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභවලින් සමන්විත සම්පත් බැහැර යාමක් සිදුවේයයි නිශ්චිත අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ආනයනය සතු වගකීමක් (නීතිමය හෝ වටහා ගත හැකි) ඇති විට අදාළ වෙන් කිරීම හඳුනා ගනී.

**2.10 ගෙවිය යුතු ශේෂය**

ගෙවිය යුතු ශේෂය ගනුදෙනුව සිදු වූ මිලට මූලිකව හඳුනාගනු ලැබේ. එම ශේෂයන් සඵලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලබයි.

**2.11 මුදල් සහ මුදල් වලට සමාන දෑ**

මුදල් සහ මුදල් වලට සමාන දෑ සමන්විත වනුයේ ඇතැති මුදල්, බැංකු සමග ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ ව්‍යවහාර මුදල් බවට ඉක්මනින් පරිවර්තනය කළ හැකි වූ දළ වටිනාකම වෙනස්වීම පිළිබඳ සැලකිය යුතු අවධානමක් නොමැති වූ ද කෙටි කාලීන හා අධික ද්‍රවශීලතා තත්වයන්, පවත්නා ආයෝජන වේ.

**2.12 ආදායම් හඳුනා ගැනීම**

අනාගත ආර්ථික ලාභ ආයතනයට ගලා එන බවට සම්භාවිතාවන් ඇත්නම් සහ ආදායම් විශ්වාසනීය ලෙස අගය කල හැකි තරමට පමණක් ආදායම් හඳුනා ගනු ලැබේ.

**සේවා සැපයීම**

සේවා සැපයීමට අදාළ ආදායම සේවාව සැපයූ කාල පරිච්ඡේදයේදී හඳුනා ගනු ලැබේ.

**පොළී ආදායම**

පොළී ආදායම සඵල පොළී අනුපාතිකය භාවිතා තරමින් වාර්තා කරනු ලැබේ,

2.13 **වියදම් හඳුනා ගැනීම**

ආදායම ඉපයීමට අදාල සියළු වියදම් එම ආදායමට එරෙහිව කපා වර්ෂය තුල ගිණුම්ගත කර ඇත. ආයතනය පවත්වාගෙන යාමට අදාළ සියළු වියදම් හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට අදාළ වියදම් ලාභයට එරෙහිව වර්ෂය තුලදී ගිණුම්ගත කර ඇත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |

**1 පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්**

| | 2018 | 2017 |
|---|---|---|
| පාඨමාලා ගාස්තු | 20,872,800.00 | 21,755,419 |
| ලියාපදිංචි ගාස්තු | 469,450.00 | 589,000 |
| විභාග ගාස්තු | 55,250.00 | 81,475 |
| සම්මන්ත්‍රණ ආදායම් | 70,000.00 | 229,500 |
| | **21,467,500.00** | **22,655,394** |

**2 ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) - මාතලේ ශාඛාව**

| | 2018 | 2017 |
|---|---|---|
| ආදායම් | | |
| පාඨමාලා ගාස්තු | 596,000.00 | 662,500 |
| වියදම් | | |
| සේවක වේතන හා ප්‍රසාද දීමනා | 492,251.92 | 517,512 |
| සේවක අර්ථසාධක අරමුදල | 36,868.86 | 35,110 |
| සේවක භාරකාර අරමුදල | 9,208.29 | 8,778 |
| ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු | 39,600.00 | 21,600 |
| විදුලිය | 7,391.00 | 10,813 |
| ක්ෂයවීම් | - | - |
| දුරකථන | 10,517.56 | 20,980 |
| අපහායනය සඳහා වෙන් කිරීම් | 67,500.00 | 138,000 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 36,258.50 | 52,765 |
| | **699,596.13** | **805,557** |
| වියදමට වැඩි ආදායම / (ආදායමට වැඩි වියදම) | **(103,596.13)** | **(143,057)** |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **3 පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්** | | |
| කාර්ය මණ්ඩල වැටුප් ප්‍රසාද දීමනා හා අතිකාල දීමනා | 2,859,810.26 | 2,044,174 |
| සේවක අර්ථසාධක අරමුදල | 232,587.59 | 165,065 |
| සේවක භාරකාර අරමුදල | 58,146.90 | 41,446 |
| දේශන ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | 2,125,683.00 | 2,075,431 |
| ප්‍රායෝගික ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | 2,095,463.85 | 1,724,742 |
| වැඩ බලන අධ්‍යක්ෂකතුමාගේ අධ්‍යයනය ගාස්තු | 60,000.00 | - |
| සම්බන්ධීකරණ ගාස්තු - (NVQ Print & Graphic Art Technology) | 50,000.00 | - |
| නඩත්තු ගාස්තු | - | 15,000 |
| තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු | 8,000.00 | 44,000 |
| සම්මන්ත්‍රණ වියදම් | 45,380.00 | 132,060 |
| ඡායා පිටපත් වියදම් | 229,850.80 | 191,843 |
| ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අමුද්‍රව්‍ය | 32,820.00 | 37,675 |
| ලිපිද්‍රව්‍ය හා මුද්දර | 148,569.00 | 193,010 |
| කුළී, විදුලිය හා ජලය | 574,500.00 | 459,000 |
| TVEC ලියාපදිංචි වියදම් / NVQ - පාඨමාලාව | 3,500.00 | - |
| දේශන ගාස්තු - කොළඹ විශ්ව විද්‍යාලය | 372,000.00 | - |
| NVQ - වියදම් | 89,000.00 | - |
| පරීක්ෂණ වියදම් - NVQ - වැඩසටහන | 50,000.00 | - |
| උසස් ඩිප්ලෝමා වැඩ සටහන සඳහා ගිය වියදම් | - | 115,000 |
| පුහුණු වැඩ සටහන් වියදම් | 307,660.00 | 528,105 |
| විභාග පරීක්ෂණ වියදම් | 50,000.00 | 31,350 |
| ප්‍රශ්න පත්‍ර පරීක්ෂණ වියදම් | 28,200.00 | 38,900 |
| සම්මාන උළෙල සඳහා වියදම් | 15,050.00 | - |
| | **9,436,221.40** | **7,836,800** |
| **4 අනෙකුත් ආදායම** | | |
| ගිය වසරේ වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීම | 2,672.00 | 8,016 |
| විවිධ ආදායම් | 15,000.00 | - |
| බැර ශේෂයන් කපා හැරීම | - | 15,385 |
| | **17,672.00** | **23,401** |
| **5 සේවක වියදම්** | | |
| කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල හා දීමනා | 3,050,528.39 | 4,021,182 |
| සේවක අර්ථසාධක අරමුදල | 247,792.71 | 291,220 |
| සේවක භාරකාර අරමුදල | 61,956.88 | 72,625 |
| කම්කරු වියදම් හා කාර්යාල කාර්ය සහායක දීමනා | 149,350.00 | 156,000 |
| සුභසාධන වියදම් | 183,847.78 | 137,412 |
| වෛද්‍ය වියදම් | 54,395.00 | - |
| කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා | 167,000.00 | 359,189 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 230,483.50 | 464,323 |
| | **4,145,354.26** | **5,501,951** |

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 6 | දේපල උපකරණ හා ක්‍රමක්ෂය | | |
| | ක්ෂයවීම් | 2,077,937.60 | 2,155,521 |
| | ක්‍රමක්ෂය | 54,108.33 | 54,108 |
| | | **2,132,045.93** | **2,209,630** |
| 7 | අනෙකුත් මෙහෙයුම් වියදම් | | |
| | සභාපතිට දීමනා | 360,000.00 | 240,000 |
| | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා | 198,000.00 | 300,000 |
| | අධ්‍යයන කටයුතු සඳහා පැමිණීමේ දීමනා | - | 3,000 |
| | තත්ව සහතික වියදම් | 30,408.00 | 30,000 |
| | ගමන් ගාස්තු | 7,465.00 | 6,091 |
| | ගමන් ගාස්තු - අලෙවි කළමනාකරුවන් සඳහා | 48,000.00 | 72,000 |
| | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම | 16,260.00 | 25,677 |
| | යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා හා නඩත්තු වියදම් | 616,217.00 | 581,017 |
| | දුරකථන | 130,138.91 | 166,093 |
| | අන්තර්ජාල සේවා ගාස්තු | 7,208.58 | 6,131 |
| | ගිණුම්කරණ වියදම් සහ අනිකුත් වෘත්තීමය වියදම් | 188,569.00 | 274,406 |
| | විගණන ගාස්තු | 262,200.00 | 120,000 |
| | ප්‍රචාරක වියදම් | 1,353,956.07 | 758,668 |
| | පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ වියදම් | 5,600.00 | 77,400 |
| | අපහායනය සඳහා වෙන් කිරීම් | 1,471,275.00 | 2,437,075 |
| | බැංකු ගාස්තු | 4,055.97 | 1,005 |
| | ඒකාබද්ධ සැලසුම් | 75,000.00 | - |
| | ප්‍රදර්ශන සඳහා වියදම් | 15,540.00 | 75,205 |
| | පරිවර්තන ගාස්තු | 37,725.00 | 34,495 |
| | වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු | 7,687.19 | 7,216 |
| | මිලදී ගැනීම් හා TEC සාමාජිකයන් | 79,000.00 | - |
| | විවිධ වියදම් | 29,439.00 | 16,395 |
| | පිරිත් පිංකම වියදම් | 10,046.00 | 13,000 |
| | වාර්ෂික වාර්තාව සඳහා ගිය වියදම් | 42,150.00 | 46,063 |
| | නිතිඥ ගාස්තු | 18,000.00 | - |
| | හර ශේෂයන් කපා හැරීම | 3,582.10 | - |
| | | **5,017,522.82** | **5,290,937** |
| 8 | ශුද්ධ මූල්‍ය ආදායම් | | |
| | පොළී ආදායම | 8,675,465.95 | 7,176,117 |
| | සේවක ණය පොළී ලැබීම් | 22,845.30 | 23,724 |
| | | **8,698,311.25** | **7,199,840** |

## දේපල පිරියත හා උපකරණ

| | | 2018/01/01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | මාරු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2018/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| **සලකනු ලබන පිරිවැය** | | | | | | |
| යන්ත්‍ර | ප්‍රධාන කාර්යාලය | 6,532,417.47 | 322,713.00 | - | - | 6,855,130.47 |
| පරිගණක | ප්‍රධාන කාර්යාලය | 8,700,777.46 | 1,362,770.00 | - | - | 10,063,547.46 |
| **පිරිවැය** | | | | | | |
| ලී බඩු හා සවි කිරීම් - | ප්‍රධාන කාර්යාලය | 1,713,257.79 | 29,835.00 | - | - | 1,743,092.79 |
| | මාතලේ ශාඛාව | 8,700.00 | - | - | - | 8,700.00 |
| කාර්යාල උපකරණ - | ප්‍රධාන කාර්යාලය | 712,466.08 | 31,240.00 | - | | 743,706.08 |
| | මාතලේ ශාඛාව | 5,750.00 | - | - | - | 5,750.00 |
| පුස්තකාල පොත් | | 732,495.89 | - | - | - | 732,495.89 |
| ඉවුම් පිහුම් උපකරණ | | 22,734.90 | 2,700.00 | - | - | 25,434.90 |
| බුමුතුරුණු | | 314,945.80 | - | - | - | 314,945.80 |
| නාම පුවරුව | | 208,410.60 | - | - | - | 208,410.60 |
| එකතුව | | **18,951,955.99** | **1,749,258.00** | **-** | **-** | **20,701,213.99** |

| **ක්ෂයවීම්** | | 2018/01/01 දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය තුල ක්ෂය කිරීම | අපහරණයන් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2018/12/31 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| **සලකනු ලබන පිරිවැය** | | | | | | |
| යන්ත්‍ර | ප්‍රධාන කාර්යාලය | 4,304,251.83 | 666,633.88 | - | - | 4,970,885.71 |
| පරිගණක | ප්‍රධාන කාර්යාලය | 6,883,719.27 | 1,231,751.39 | - | - | 8,115,470.66 |
| **පිරිවැය** | | | | | | |
| ලී බඩු හා සවි කිරීම් | ප්‍රධාන කාර්යාලය | 754,599.59 | 132,832.86 | - | | 887,432.45 |
| | මාතලේ ශාඛාව | 8,700.00 | - | - | - | 8,700.00 |
| කාර්යාල උපකරණ - | ප්‍රධාන කාර්යාලය | 612,411.43 | 17,386.86 | - | - | 629,798.30 |
| | මාතලේ ශාඛාව | 5,750.00 | - | - | - | 5,750.00 |
| පුස්තකාල පොත් | | 721,157.30 | 3,679.56 | - | - | 724,836.87 |
| ඉවුම් පිහුම් උපකරණ | | 12,646.90 | 1,343.50 | - | - | 13,990.40 |
| බුමුතුරුණු | | 302,920.37 | 4,008.48 | - | - | 306,928.85 |
| නාම පුවරුව | | 51,578.93 | 20,301.06 | - | - | 71,879.99 |
| එකතුව | | **13,657,735.62** | **2,077,937.60** | **-** | **-** | **15,735,673.23** |
| ශුද්ධ පොත් අගය | | **5,294,220.37** | | | | **4,965,540.76** |

| දෙසැම්බර් 31 දිනට | | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|---|
| **10 අස්පෘශ්‍ය වත්කම්** | | | | |
| **පරිගණක මෘදුකාංග** | | | | |
| **පිරිවැය** | | | | |
| ආරම්භක ශේෂය | | | 234,565.00 | 234,565 |
| එකතුකිරීම් | | | - | - |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම් | | | - | - |
| වසර අවසාන ශේෂය | | | 234,565.00 | 234,565 |
| **සමුච්චිත කපා හැරී අගය** | | | | |
| ආරම්භක ශේෂය | | | 177,485.83 | 123,378 |
| කපා හැරීම් | | | 54,108.33 | 54,108 |
| වසර අවසාන ශේෂය | | | 231,594.16 | 177,486 |
| වසර අවසාන ශුද්ධ ශේෂය | | | 2,970.84 | 57,079 |
| **11 වෙළඳ හා අනෙකුත් ලබීම්** | | | | |
| ආදායම් ලැබීම් - සම්මන්ත්‍රණ | | | - | 36,000 |
| ආදායම් ලැබීම් - පාඨමාලා | | | 293,000.00 | |
| ණයගැතියන් | | 11.1 | 3,614,300.00 | 5,178,775 |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | | 11.2 | 882,765.67 | 531,237 |
| | | | 4,790,065.67 | 5,746,012 |
| **11.1 ණය ගැතියන්** | | | | |
| ණයගැතියන් - | ප්‍රධාන කාර්යාලය | | 7,587,099.50 | 10,642,825 |
| | මාතලේ ශාඛාව | | 640,450.00 | 573,450 |
| | | | 8,227,549.50 | 11,216,275 |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම් - | ප්‍රධාන කාර්යාලය | | (4,160,299.50) | (5,652,050) |
| | මාතලේ ශාඛාව | | (452,950.00) | (385,450) |
| | | | 3,614,300.00 | 5,178,775 |
| **11.2 කාර්ය මණ්ඩල ණය ගැතියන්** | | | | |
| ණය - | එම්. ඩබ් සනත් | | 94,455.00 | 161,115 |
| | එම්. ටී. ඩී. විජේසිරි | | 15,000.00 | - |
| | චමල් හෙට්ටිආරච්චි | | 548,007.00 | 11,130 |
| | ඩබ් ඒ. එම්. ලංකාතිලක | | - | 8,000 |
| | ඩී. එස්. එස්. බරණාගේ | | - | 11,130 |
| | සමන්ත කුලතුංග | | 25,000.20 | 75,000 |
| | පී.කේ.ඩී. ලියනගේ | | 190,720.00 | 194,445 |
| | යාපා දහනායක | | 8,333.48 | 54,167 |
| උත්සව දීමනා - | ප්‍රධාන කාර්යාලය | | 1,250.00 | 16,250 |
| | | | 882,765.67 | 531,237 |

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **12 අත්තිකාරම් හා කලින් කල ගෙවීම්** | | | |
| නව ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම් | | - | 3,582 |
| BMICH | | 300,000.00 | - |
| **කලින් කල ගෙවීම්** | | | |
| දේශන ගාස්තු - කොළඹ විශ්ව විද්‍යාලය | | 1,344,000.00 | - |
| වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු | | 6,979.49 | 6,291 |
| | | **1,650,979.49** | **9,873** |
| **13 කෙටි කාලීන ආයෝජන** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | 2,761,134.83 | 2,520,166 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළී ලැබීම් | | 134,102.75 | 133,741 |
| | | **2,895,237.58** | **2,653,908** |
| ස්ථාවර තැන්පත් | | 64,711,782.57 | 71,334,669 |
| ස්ථාවර තැන්පත් මත පොළී ලැබීම් | | 3,732,862.46 | 4,658,905 |
| | | **68,444,645.03** | **75,993,574** |
| | | **71,339,882.61** | **78,647,482** |
| **14 මුදල් හා මුදල් වලට සමාන දෑ** | | | |
| මහජන බැංකුව - ජංගම ගිණුම් අංක | i | 2,738,890.03 | 3,001,686 |
| ජංගම ගිණුම් අංක | ii | 1,086,122.91 | 557,123 |
| අතැති මුදල් | | 5,071.00 | 5,373 |
| | | **3,830,083.94** | **3,564,182** |
| **15 සමුච්චිත අරමුදල** | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 90,511,140.21 | 81,614,880 |
| විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් මාරු කිරීම | | 9,348,742.72 | 8,896,260 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **99,859,882.93** | **90,511,140** |
| **16 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්** | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 1,134,549.00 | 1,109,524 |
| **වර්ෂය තුල වෙන් කිරීම්** | | | |
| ප්‍රධාන කාර්යාලය | | 230,483.50 | 464,323 |
| මාතලේ ශාඛාව | | 36,258.50 | 52,765 |
| | | **1,401,291.00** | **1,626,612** |
| වර්ෂය තුල ගෙවීම් | | - | (492,063) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **1,401,291.00** | **1,134,549** |

D.H.P. MUNASINGHE & CO. CHARTERED ACCOUNTANTS

| දෙසැම්බර් 31 දිනට | | | 2018 | 2017 |
|---|---|---|---|---|
| | | සටහන් | රු. | රු. |
| **17** | **වෙළඳ හා අනෙකුත් ගෙවීම්** | | | |
| | අත්තිකාරම්වලින් ලද ආදායම | | 1,109,350.00 | 45,350 |
| | සම්මාන උළෙල සඳහා අත්තිකාරම් ලැබීම් | | 394,100.00 | - |
| | උපචිත වියදම් | 17.1 | 1,900,570.47 | 1,627,809 |
| | | | **3,404,020.47** | **1,673,159** |

**17.1 උපචිත වියදම්**

| | | 2018 | 2017 |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහායකට දීමනා | | 16,625.34 | 8,065 |
| ගිණුම්කරණ ගාස්තු සහ අනිකුත් වෘත්තීමය ගාස්තු | | 81,710.00 | 182,302 |
| විගණන ගාස්තු | | 740,280.00 | 740,280 |
| වැටුප් හා අතිකාල දීමනා | | 9,572.43 | 13,657 |
| ප්‍රායෝගික ගාස්තු - | මූලස්ථානය | 214,770.00 | 132,368 |
| දේශන ගාස්තු | | 239,100.00 | 148,500 |
| අන්තර්ජාල සේවා ගාස්තු | | 2,409.96 | 958 |
| සුභසාධන වියදම් | | 24,736.00 | 6,000 |
| ඒකාබද්ධ අරමුදල් - | රැස්වීම් සඳහා පැමිණීමේ ගාස්තු | 79,043.39 | 957 |
| දුරකථන - | මූලස්ථානය | 10,341.94 | 37,101 |
| | මාතලේ | 3,078.07 | - |
| ඡායා පිටපත් වියදම් | | 15,841.84 | 15,842 |
| තොරතුරු තාක්ෂණ උපකරණ ගාස්තු | | - | 4,000 |
| ප්‍රසාද දීමනා - | මූලස්ථානය | 312,500.00 | 300,000 |
| | මාතලේ | 30,000.00 | 30,000 |
| උපයන විට ගෙවන බදු | | 2,200.00 | - |
| විදුලිය - | මාතලේ | 880.50 | 2,500 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 750.00 | - |
| ප්‍රචාරක වියදම් | | 68,931.00 | - |
| විභාග පරීක්ෂණ වියදම් | | 7,800.00 | 3,900 |
| සේවක අර්ථසාධක අරමුදල | | - | 1,200 |
| සේවක භාරකාර අරමුදල | | - | 180 |
| සම්බන්ධීකරණ ගාස්තු - | (NVQ Print & Graphic Art Technology) | 20,000.00 | - |
| සියළු පරීක්ෂණ ගාස්තු - | NVQ - වැඩසටහන | 20,000.00 | - |
| | | **1,900,570.47** | **1,627,809** |

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

## 18 සම්බන්ධිත පාර්ශවයන් සමග කරන ගනුදෙනු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙහි සභාපති වන පී.කේ.ඩී. ලියනගේ මහත්මිය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලාධිපතිනිය ධුරය දරණු ලැබේ. පහත සඳහන් ගනුදෙනු මෙම සම්බන්ධිත පාර්ශව අතේ මෙම වර්ෂයේ සිදු වී ඇත.

| | |
|---|---|
| කුළිය, විදුලිය හා ජලය | 574,500 |

D.H.P. MUNAWEERA & CO. CHARTERED ACCOUNTANTS

# විගණකාධිපති වාර්තාව හා පිළිතුරු 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | VTY/D/SLIOP/01/18/05 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020 අගෝස්තු 28 දින |

ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම්- මුදල් අමාත්‍යාංශය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: VTY/D/SLIOP/01/18/05 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2020 අගෝස්තු 28 දින

ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ ප්‍රසිද්ධ ගිණුම් කටයුතුභාවය (Public accountability) සහිත ආයතන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර නොගත යුතු වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක 2.1 (අ) ප්‍රකාරව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 17 හි 17.15 A වගන්තිය ප්‍රකාරව,දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොකිරීම හේතුවෙන්, තවදුරටත් භාවිතයට ගනිමින් පවතින අයිතම 09 කට අයත් වටිනාකම රු. 8,826,619 ක් වූ වත්කම් 223 ක අගය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ශුන්‍ය වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ගිණුම්කරණ සටහන් අනුව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මැනීම සඳහා පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය (projected unit credit method) භාවිතා කරන බව දක්වා තිබුණද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් වල පර්ච්ඡේද 28 හි 28.17 හා 28.18 වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දී ආයතනයට පවරා දී තිබුණු ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර,එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

  හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(අ) සහ (ඇ) ඡේදවල සඳහන් නිර්දේශ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XXX වන පරිච්ඡේදයේ 1.4 වගන්තිය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවසරයකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් පස් දෙනෙකු සාමාන්‍ය රාජකාරි වලට පරිභාහිරව දේශකවරුන් ලෙස කටයුතු කර සමාලෝචිත වර්ෂය තුල දේශන පැය 383ක් සඳහා එකතුව රු.241,627 ක් ගෙවා තිබුණි. |
| (ii) IX වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය හා XXX වන පරිච්ඡේදය | නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි 2018 ජනවාරි සිට 2019 ජුලි දක්වා කාලපරිච්ඡේදය තුල රාජ්‍ය භාගය අඩුකිරීමෙන් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිළධාරීන් 07 දෙනෙකු සඳහා දේශක ගාස්තු ලෙස එකතුව රු.141,850 ක් ගෙවා තිබුණි. |
| (ආ) (i) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි 10 සහ 12 වගන්ති | නිළධාරීන් සඳහා අනුමත ණය යෝජනා ක්‍රමවලට පරිභාහිරව සහ ආයතනය ආරම්භ කිරීමේ අරමුණුවලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව ණය යෝජනාක්‍රමයක් ක්‍රියාත්මක වේ. එම ණය යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි සඳහන් ප්‍රතිපාදන අනුව ණය ලබා ගැනීමට හිමිකමක් නොමැති, පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන |

| | |
|---|---|
| | මුද්‍රණාලයාධිපති වෙත 2018 නොවැම්බර් මාසයේදී රු. 200,000 ක ණය මුදලක් ගෙවා තිබුණි. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 මැයි 27 දින දක්වා ප්‍රමාද කර තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 03. වෙනත් නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල පාඨමාලා සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව මාස 07 ක කාලපරිච්ඡේදය තුල නියමිත දිනයන්හි පාඨමාලා නොපැවැත් වීම මත පාඨමාලා සඳහා ඉල්ලුම් කළ සිසුන් 14 දෙනෙකුට එම පාඨමාලා හැදෑරීමට අවස්ථාව නොලැබී තිබීම නිසා එකතුව රු. 162,250 ක් එම සිසුන්ට නැවත ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 5) ලබාගැනීමේ අරමුණෙන් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ රු.68,065,681 ක් වැය කර 2019 පෙබරවාරි මාසයේ දී මුද්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණද විගණන දිනය වූ 2020 ජූලි 06 දින වන විටත් එම පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ආයතනය විසින් ආරම්භ කර තිබූ මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් ආයතනයේ පාලක මණ්ඩල සභාපති ලෙස කටයුතු කරන රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු නිළධාරීන් තුන්දෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.420,000 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමක අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

ප්‍රශ්නය

(අ) භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ ප්‍රසිද්ධ ගිණුම් කටයුතුභාවය (Public Accountability) සහිත ආයතන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර නොගත යුතු වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක 2.1(අ)ප්‍රකාරවආයතනයේමූල්‍යප්‍රකාශනකුඩාහාමධ්‍යපරිමාණව්‍යාපාරසඳහාවනශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණි.

පිළිතුර

(අ) මූල්‍ය වාර්තා පිළියල කිරීමේ පදනම

මේ සම්බන්ධව අපගේ වරලත් ගණකාධිකාරීන් වන D. H. P. මුණවීර ආයතනයෙන් විමසන ලදුව ඔවුන්ගේ මතය ඔබ වෙත දන්වා එවමි.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය වාර්තා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. ඔබ විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව මෙම ආයතනය භාණ්ඩ විකුණනු ලබන හෝ සේවා සපයන රාජ්‍ය සංස්ථාවක් නොවන නිසා තව දුරටත් ආයතනයේ මූල්‍ය වාර්තා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කලයුතු බව අපගේ අදහස වේ.

අදල ගිණුම් ප්‍රමිතීන් හා විෂය පථය දක්වෙන කොටසේ විශේෂයෙන්ම එම විෂය පථයෙන් බැහැර වන කොටසේ ඡායා පිටපත් ද මේ සමඟ ඔබගේ අධ්‍යයනය සඳහා එවන්නෙමු.

ප්‍රශ්නය

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 17 හි 17.15 A වගන්තිය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ වල එලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නිවැරදි වටිනාකම මූල්‍යප්‍රකාශන වල සටහන් නොකිරීම හේතුවෙන්, තවදුරටත් භාවිතයට ගනිමින් පවතින අයිතම 09 කට අයත් වටිනාකම රු. 8,826,619 ක් වූ වත්කම් 223 ක අගය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ශුන්‍ය වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

පිළිතුර

(ආ) ඉදිරි වර්ෂයේදී මෙසේ ශුන්‍ය වටිනාකමින් යුතු වත්කම් නැවත සකසා ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රශ්නය

(ඇ) ගිණුම්කරණ සටහන් අනුව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මැනීම සඳහා පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය (Projected unit credit method) භාවිතා කරන බව දක්වා තිබුණද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වල පරිච්ඡේද 28 හි 28.17 හා 28.18 වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි.

**පිළිතුර**

(ඇ) ඉදිරියේදී මේ සම්බන්ධ කටයුතු කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.

**ප්‍රශ්නය**

(ඈ) 2013 වර්ෂයේ දී ආයතනයට පවරා දී තිබූ ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

**පිළිතුර**

(ඈ) මෙම ඉඩමෙන් කොටසක් මෙගා පොලිස් ආයතනය මගින් ලෙස්ලි රණගල මාවත පුළුල් කිරීම සඳහා අත්පත් කර ගන්නා ලදී. නැවත මිනුම් ගත කොට අවශ්‍ය කටයුතු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් සෑදීම සඳහා රජයෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර ඊට අදාලව සාක්ෂාත් වාර්තාවක් සහ අයදුම්පතක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

**ප්‍රශ්නය**

| <u>නීතිරීති/ විධානයට යොමුව</u> | <u>විස්තරය</u> |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XXX වන පරිච්ඡේදයේ 1.4 වගන්තිය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවසරයකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් පස් දෙනෙකු සාමාන්‍ය රාජකාරී වලට පරිබාහිරව දේශකවරුන් ලෙස කටයුතු කර සමාලෝචිත වර්ෂය තුල දේශන පැය 383 ක් සඳහා එකතුව රු.241,627 ක් ගෙවා තිබුණි. |

**පිළිතුර**

(අ) මෙම දේශකවරුන් පත් කරනු ලැබුවේ රජයේ මුද්‍රණාලයට බඳවාගත් පුහුණුලාභීන් 88 දෙනෙකු සඳහා NVQ (5) පාඨමාලාව සඳහා දේශන පැවැත්වීමටය. මුද්‍රණ ක්ෂේත්‍රයේ දැනුම ඇති තාක්ෂණික නිපුණතාවලින් පරිපූර්ණ දේශක මඬුල්ලක් අත්‍යාවශ්‍ය වූ අතර එබැවින් මෙම දේශකවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදුවිය. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආරම්භ වූ දින සිටම මේ ලෙසට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ සහාය ලබාගෙන ඇත.

**ප්‍රශ්නය**

| | |
|---|---|
| (ii) IX වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය හා XXX වන පරිච්ඡේදය | නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි 2018 ජනවාරි සිට 2019 ජූලි දක්වා කාල පරිච්ඡේදය තුල රාජ්‍ය භාගය අඩුකිරීමකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිළධාරීන් 07 දෙනෙකු සඳහා දේශක ගාස්තු ලෙස එකතුව රු. 141,850 ක් ගෙවා තිබුණි. |

පිළිතුර

(ii) රජයේ මුද්‍රණාලයේ සේවය කරන සමහර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ භාහිර කථිකාචාර්යවරුන් වශයෙන් සේවය කරන්නේ මෙම ආයතනය ආරම්භ වූ දින සිටය. මෙම නිලධාරීන්ගෙන් උපයන මුදලින් 10% ක් කපා ඒකාබද්ධ අරමුදලට බැහැර කිරීම සිදුවේ.

මෙම අදාල දේශකවරුන්ට ගෙවන දේශන ගාස්තු වලින් අවස්ථා කිහිපයක දී පමණක් ඒකාබද්ධ අරමුදලට අදාල 10% මුදල අඩුකර ගැනීම අතපසු වී ඇත. ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදුනොවන අතර ඒකාබද්ධ අරමුදලට අයත් මුදල් එම දේශකවරුන්ගේ දේශන ගාස්තු වලින් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රශ්නය

(ආ) (i) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි 10 සහ 12 වගන්ති

නිලධාරීන් සඳහා අනුමත ණය යෝජනා ක්‍රමවලට පරිභාහිරව සහ ආයතනය ආරම්භ කිරීමේ අරමුණුවලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව ණය යෝජනාක්‍රමයක් ක්‍රියාත්මක වේ.

එම ණය යෝජනා ක්‍රමය මගින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි සඳහන් ප්‍රතිපාදන අනුව ණය ලබාගැනීමට හිමිකමක් නොමැති, පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන මුද්‍රණාලයාධිපති වෙත 2018 නොවැම්බර් මාසයේදී රු. 200,000 ක ණය මුදලක් ගෙවා තිබුණි.

පිළිතුර

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය භාණ්ඩාගාරයේ අරමුදල් නොලබන ස්වයං උත්පාදන ආයතනයකි. මෙම ආයතනය 1984 අංක 18 දරණ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත වූ අතර එම පනතට අනුව ආයතනය තුල සිදුවන පරිපාලන හා ක්‍රියාකාරී කටයුතු පාලනය කිරීම සහ තීරණ ගැනීම සභාපති ඇතුලු පාලක මණ්ඩලයට පූර්ණ බලතල ඇත. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙන් සේවකයන්ට ණය මුදලක් ලබා දෙයි. එය පාලක මණ්ඩලය මගින් අනුමත කර ඇත්තේ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙන් දෙන ණය මුදල ලෙසය. මෙය ආපද ණය මුදලක් නොව ඕනෑම අවස්ථාවක සේවක මහතෙකුට ලබාගත හැකි ණය මුදලකි. මෙම ණය මුදල සේවක මහතුන් වෙත ලබාදීමෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 4.2% පොලියක් උපයා ගනී. එය ආයතනයට ආයෝජනයක් වේ. ආයතනයේ සභාපතිතුමයට මෙම ණය මුදල ලබා දී ඇත්තේ 4.2% ක පොලී අනුපාතයකට යටත්වය. එතුමිය ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සභාපති මෙන්ම රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තුමිය ද වෙයි. එතුමියට මෙම ණය මුදල ලබාදීමට තීරණය කලේ ඇය රජයේ මුද්‍රණාලයේ ස්ථිර සේවකයෙකු වන නිසාත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සභාපති තනතුරට අමතරව භාහිර කථිකාචාර්යවරයෙකු ලෙස මේ දක්වා අවුරුදු 20 ක කාලයක් සේවය කරන නිසාත්ය. මේ ණය මුදල ලබා ගැනීම සඳහා ඇය අප ආයතනය සමඟ ඇපකරුවන්ට යටත්ව ගිවිසුමක් ද අත්සන් කොට ඇත.

ප්‍රශ්නය

(ii) 2003 ජුනි 02 දිනැති අංක පිඑඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත ව්‍යාපාර චක්‍රලේඛයේ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 මැයි 27 දින දක්වා ප්‍රමාද කර තිබුණි.

පිළිතුර

මෙසේ ප්‍රමාද වීමට හේතු වූයේ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම ප්‍රමාද වූ නිසාය. ඒ අනුව විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබන ගිණුම් වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට අත්සන් කර එවිය යුතු බැවින් මෙම ප්‍රමාදය සිදුවිය.

ප්‍රශ්නය

03. වෙනත් නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල පාඨමාලා සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව මාස 07 ක කාල පරිච්ඡේදය තුල නියමිත දිනයන්හි පාඨමාලා නොපැවැත්වීම මත පාඨමාලා සඳහා ඉල්ලුම් කළ සිසුන් 14 දෙනෙකුට එම පාඨමාලා හැදෑරීමට අවස්ථාව නොලැබී තිබීම නිසා එකතුව රු.162,250 ක් එම සිසුන්ට නැවත ගෙවීමට සිදුවී තිබුණි.

පිළිතුරු

(අ) යම් පාඨමාලාවක් ආරම්භ කිරීමේ දී දින තීරණය කරනු ලබන්නේ අදල පාඨමාලාව සඳහා අවශ්‍ය අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුලත් වූ පසුවය. මේ අනුව සමහර පන්ති කලින් ආරම්භ කරන අතර සමහර පන්ති ප්‍රමාද වේ. අදල ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වීම ප්‍රමාද වී පන්ති ආරම්භ වන දිනය ප්‍රමාද වූ විට පාඨමාලාවට මුදල් ගෙවූ යම් අයෙකු පාඨමාලා ගාස්තු නැවත ඉල්ලුම් කරන්නේ නම් එම පාඨමාලා ගාස්තු ආපසු ගෙවනු ලැබේ. බොහෝ අවස්ථාවල ඒ වෙනුවට ප්‍රමාද වී ඇතුල්වීමට පැමිණෙන වෙනත් අයෙකු පාඨමාලාවට බඳවා ගැනීමෙන් අනතුරුව අදල පාඨමාලාව ආරම්භ කෙරේ. මෙහිදී බොහෝ අවස්ථාවල ආයතනට පාඩුවක් සිදුනොවේ.

ප්‍රශ්නය

(ආ) මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) 5 ලබාගැනීමේ අරමුණෙන් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ රු.68,065,681 ක් වැයකර 2019 පෙබරවාරි මාසයේ දී මුද්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණද විගණන දිනය වූ 2020 ජූලි 06 දින වන විටත් එම පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

පිළිතුර

(ආ) යන්ත්‍රය මිලදී ගැනීමේ අරමුණු කීපයක් ඇත. ඒවා විස්තරාත්මකව පහත සඳහන් වේ.

01. දැනට අප ආයතනය මගින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලා වලට ප්‍රායෝගික වර්ණ මුද්‍රණ තාක්ෂණය ඇතුලත් කිරීම.

1. Offset Machine Operation for school leavers
2. Sheet Fed Lithography
3. Offset Lithography
4. Diploma in Graphic Design
5. Advanced Diploma in Printing Technology and Management

02. ආයතනය මගින් සංවිධානය කරන විශේෂ භාහිර ආයතනික පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණය/ වැඩමුළු සඳහා මෙම වර්ණ මුද්‍රණ තාක්‍ෂණය ඇතුලත් කෙරේ.

03. දනට Offset Machine Operation for school leavers පාඨමාලාව NVQ 3 මට්ටමේ පවතින අතර මෙම නව යන්ත්‍රය ලැබීමත් සමඟ NVQ 4 මට්ටම දක්වා උසස් කිරීම. මක් නිසාද යත් NVQ 4 මට්ටම ලබා දීම සඳහා වර්ණ මුද්‍රණ යන්ත්‍රයක දැනුම හා පුහුණුව අත්‍යාවශ්‍යය.

04. ආයතනය මගින් පවත්වනු ලබන Print & Graphic Arts Diploma NVQ 5 පාඨමාලාවේ අන්තර්ගතයට ප්‍රායෝගික වර්ණ මුද්‍රණ යන්ත්‍ර තාක්‍ෂණය ඇතුලත් කිරීම. 2019 අගෝස්තු 20 වන විට NVQ 5 ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ ශිෂ්‍යයන්ට මෙම පුහුණුව ලබා දී ඇත.

**ප්‍රශ්නය**

(ඇ) ආයතනය විසින් ආරම්භ කර තිබූ මුද්‍රණ හා ග්‍රැෆික් තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් ආයතනයේ පාලක මණ්ඩල සභාපති ලෙස කටයුතු කරන රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු නිලධාරීන් තුන්දෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.420,000 ක් ගෙවා තිබුණි.

**පිළිතුර**

(ඇ) මෙම පාඨමාලාව අප ආයතනය විසින් පවත්වන සාමාන්‍ය පාඨමාලා බණ්ඩයට නොවැටෙන, රජයේ මුද්‍රණාලයේ ඉල්ලීම මත සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද විශේෂ පාඨමාලාවකි. තවද පුහුණුලාභීන් 88 ක් පුහුණු පාඨමාලාව සඳහා පූර්ණකාලීන ලෙස අනුයුක්ත කරන ලද අතර එම ප්‍රමාණයේ ශිෂ්‍ය ප්‍රමාණයක් මෙහෙයවමින් පූර්ණ කාලීනව පුහුණු කටයුතු සිදුකල පාඨමාලාවක් මීට පෙර ආයතනයේ පවත්වා නොතිබුණි.

තවද පුහුණුව සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්‍ය මණ්ඩලය දේශකයින් වශයෙන් සහභාගී කර ගැනීමටත්, ප්‍රායෝගික වැඩ සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර සහ අනෙකුත් සම්පත් යොදා ගැනීමත් අනිවාර්ය අංගයක් විය. පාඨමාලාවට ගැලපෙන මට්ටමෙන් මෙම සම්පත් දේශීයව ලබාගත හැකි කිසිදු ආයතනයක් ලංකාවේ අප දැනුවත්ව නොමැති අතර, ඒ අනුව ඇතිවූ අන්තර් ආයතනික සම්බන්ධීකරණ කටයුතු වල තිබූ දැඩි අවශ්‍යතාවය නම්කර ඇති නිලධාරීන්ට සම්බන්ධ ගාස්තු ගෙවීමේ පදනම වූ බව විගණනයට දන්වීමට කැමැත්තෙමි.

මේ ගෙවීම් සඳහා පාලක මණ්ඩලයේ ඉදිරි අනුමැතියට යටත්ව, එම දිනට පාලක මණ්ඩලය නොතිබීම යන කරුණු මත පාලක මණ්ඩල සභාපතිනියගේ අනුමැතිය ලබාගෙන ඇති බවට විගණනයට තව දුරටත් දන්වීමට කැමැත්තෙමි.

# ආයතනික දියුණුව සඳහා ගන්නා ලද මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග

ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ කරා ළඟා වීම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

## ප්‍රගති සාරාංශය

| | | |
|---|---|---|
| ඇතුලත් වුනු සිසුන් ගණන | - | 1017 |
| මුළු ආධායම | - | රු.30,079,887.00 |
| ලාභය | - | රු.9,348,743.00 |
| තැන්පතු | - | රු.71,339,882.61 |

## 1. සේවා සැපයීමේ දියුණුව

### 1.1 පාඨමාලා

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය දැනට පවත්වා ගෙන යනු ලබන පාඨමාලා එලෙසින්ම පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ පවත්වා ගෙන යෑම.

**පාඨමාලා**

**මුද්‍රණ තාක්‍ෂණය** | **ග්‍රැපික්ස් තාක්‍ෂණය** | **මල්ටිමීඩියා තාක්‍ෂණය**

- විවිධ වෘත්තීය මාර්ග ඔස්සේ මෙම පාඨමාලා සංවර්ධය කර ඇත.සියලු පාඨමාලා වසර 3 කට වරක් හෝ ගෝලීය තාක්‍ෂණික වෙනස්වීම් වලට අදාලව සංශෝධනය කරනු ලැබේ.

### 1.2 සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- පාසැල් හැරගිය සිසුන් සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා ඒ ආශ්‍රයෙන් ක්‍ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනයට මාර්ගෝපදේශ සපයනු ලැබේ.

- තාක්‍ෂණික වැඩමුලු පවත්වා ක්‍ෂේත්‍රයේ නියැලි සේවක මහතුන්ට නව තාක්‍ෂණය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දේ.මේ තුලින් ඔවුන් සතු කුසලතා සහ නුවණ වර්ධනය කෙරේ.

### 1.3 විශේෂ පුහුණු වැඩසටහන්

රජයේ සහ පෞද්ගලික ආයතන වල ඉල්ලීම අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මුද්‍රණ ග්‍රැපික්ස් සහ මල්ටිමීඩියා ක්‍ෂේත්‍රයට අදාල පාඨමාලා අලලා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

### 1.4 මුද්‍රණ හා ග්‍රැපික්ස් ක්‍ෂේත්‍රය නැංවීම

- නව තාක්‍ෂණයට අනුව සීඝ්‍රයෙන් දියුණුවන මුද්‍රණ තාක්‍ෂණයට සරිලන ලෙස යන්ත්‍රෝපකරණ සහ මනුෂ්‍ය සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාල පාඨමාලා සම්මන්ත්‍රණ, සංදර්ශන සහ වැඩමුළු වලට ආයතනය මෙන්ම සේවක මහතුන්ද සහභාගී කරවනු ලැබේ.

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ දේශක වරයෙකු ගෝලීය මුද්‍රණ සහ ග්‍රැපික්ස් තාක්‍ෂණික දියුණුව පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මසක කාලයක් ජර්මන් රාජ්‍යයේ Print Promotion ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී කරවන ලදී.

- නවීන තාක්‍ෂණයෙන් යුත් වර්ණ 4 ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් ආයතනය මිලදී ගෙන ඇත.

## 2. ආයතනික සේවාවන් ප්‍රසිද්ධ කිරීම සහ සංවර්ධනය

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන සේවාවන් පිළිබඳ පුවත්පත් වාර්තා පල කිරීම සහ රූපවාහිනී ආයතනය සමග සාකච්ඡා පැවැත්වීම තුලින් දිවයිනේ සිසුන්ට ආයතනය පිළිබඳ දැනුවත් කිරීම.රජයේ ගැසට් නිවේදන ආධාරයෙන් පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

- නව තාක්‍ෂණික පහසුකම් සහිත වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ හරහා තොරතුරු සැපයීම හා දත්ත ලබා ගැනීම.

- ආයතනික ප්‍රචාරණය උදෙසා facebook & You tube තාක්‍ෂණය යෙදවීම.

- ISO 9001:2015 නව එලද්‍රායිතා සහතිකය ලබා ගැනීම

## 3. ආයතනික ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව බොරැල්ලේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යාබදව පර්චස් 40 ක ඉඩමක් අත්පත් කරගෙන ඇත.මෙම නව ගොඩනැගිල්ල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ධාරිතාව වැඩි කිරීම සඳහා ආධාර වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩාත් හොඳ පහසුකම් ලබා දීමටද අවස්ථාව උදා කර දේ.මෙම ඉදිකිරීම උදෙසා රජයෙන් ආධාර බලාපොරොත්තු වන අතර ඒ සඳහා දෙවන වරටත් ව්‍යාපෘති වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.